**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී.විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 24 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී . මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම ,විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත . මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිළධාරිගේ හා ගණන්දීමේ නිළධාරිගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිළධාරි සහ ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

**-----------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,
- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**---------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාල පුනරාවර්තන වියදම ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාසික ගිණුම් සාරාංශ සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අතර,එක් වැය විෂයක රු.369,271 ක වෙනසක් පැවතුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාසික ගිණුම් සාරාංශය හා භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනයේ සඳහන් වියදම් අතර නොසැසඳීම් ගැලපිය යුතුවේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 266/2018 චක්‍රලේඛනයේ 4 ඡේදය ප්‍රකාරව ලබාදී ඇති අවස්ථා මඟින් වැරදි නිවැරදි කර ඇත. |
| (ii) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019 වර්ෂයේ තුළ ගෙවා තිබූ 2018 වර්ෂයට අදාල එකතුව රු. 499,224 ක් වූ බැරකම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය තුළ දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ අවසානයට බැරකම් නිශ්චිතව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්විය යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඒකාබද්ධ සැසඳුම් ප්‍රකාශය අනුව වෙනත් විවිධ රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට නිරවුල් කල යුතු ණය ශේෂ යටතේ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකුගේ රු.241,772 ක ණය ශේෂයක් දක්වා ඇතත්, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සකස් කරන ලද සැසඳුම් ප්‍රකාශයේ එවැනි ණය ශේෂයක් සඳහන් කර නොතිබුණි. | කේවල ශේෂ වෙනසක්ම සසඳා ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කල යුතුවේ. | ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපත් කර ඇති සැසඳුම් ප්‍රකාශයේ 3.9 උපලේඛනය යටතේ දක්වා ඇත. |

**(ඇ) තැන්පතු**

මූල්‍ය ප්‍රකාශනවලට අදාල තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 6000-0-0-17-0030 දරන තැන්පත් ගිණුමෙහි 2018 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාසික ගිණුම් සාරාංශ හා මූල්‍ය ප්‍රකාශන අනුව රු.134,259 ක හර ශේෂයක් දක්වා තිබුණි. | ගිණුම් තැබීමේ ක්‍රමවේදය නිවැරදි කල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

**(ඈ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ඒ.සී.ඒ. 6 ආකෘතියෙහි මූල්‍ය නොවන වත්කම්හි ආරම්භක ශේෂයන්ගේ නිවැරදි එකතුව රු. 1,231,513,599 ක් වුවද, එහි එකතුව රු. 1,138,813,599 ක් ලෙස ගෙන තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි වටිනාකම් පෙන්විය යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ ශේෂය රු.1,031,626,754 ක් ලෙස දක්වා තිබුණ ද, 2018 ජනවාරි 01 දිනට එම ශේෂය රු. 1,138,813,599 ක් ලෙස දක්වා තිබුණි. | පෙර වර්ෂයේ අවසාන ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳිය යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

**1.6.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතිකවීම්**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | ------------------------ |
| (i) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.11 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිගත හැකි පිළිතුරක් ලබාදී නොමැත. |

### 1.6.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රය | | | | |
| (i) | XIX පරිච්ඡේදයේ 7.1 ඡේදය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 03 ක ගිවිසුම්ගත කාලය ඉක්මවා පදිංචිව සිටින නිලධාරීන් 03 දෙනෙකු සම්බන්ධයෙන් 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ගැනීම) පනතේ 3 වගන්තිය යටතේ නිකුත් කරන ලද අස්කිරීමේ නිවේදන යවා තිබුණ ද, නිවාස සන්තකය ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.1 ඡේදය ප්‍රකාරව නිවාස සන්තකය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාගැනීමට කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. |
| (ii) | XIX පරිච්ඡේදයේ 7.2 ඡේදය | 138,535 | බදු කාලය ඉක්මවා රජයේ නිවාසවල පදිංචි වී සිටි කාල පරිච්ඡේදය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් 03 දෙනෙකුගෙන් දන්ඩන කුලිය අයකරගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 ඡේදය ප්‍රකාරව දණ්ඩන කුලිය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ----------------- | | | | |
| (i) | මුදල් රෙගුලාසි 66, 69 | 1,238,647 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2018 වර්ෂය තුළදී 275-1-1-0-2102 සහ 275-1-1-0-1409 යන වැය විෂයන් සඳහා හර කල යුතු රු. 511,803 ක් 275-1-1-0-2002 වැය විෂයෙන්ද, 275-1-1-0-1301 යන වැය විෂය සඳහා හර කල යුතු එකතුව රු. 558,013 ක වියදම් 275-1-1-0-2003 වැය විෂයෙන් ද, 275-1-1-0-1409 යන වැය විෂය සඳහා හරකල යුතු රු. 168,831 වියදමක් 275-1-1-0-1301 වැය විෂයෙන් ද අනුමැතිය ලබා ගැනීමකින් තොරව දරා තිබුණි. | මුදල් රෙගුලාසි 66, 69 හි විධිවිධාන ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතුවේ. | නිශ්චිත පිළිතුරක් ලබාදී නොමැත. |
| (ii) | මුදල් රෙගුලාසි 104(4) | 669,630 | වැලිකන්ද සහ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් කැබ් රථ 02 කට අවස්ථා 03 කදී සිදු වූ අනතුරුවලින් වූ අලාභය සම්බන්ධයෙන් තුන් මසක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව තුන් මසක් ඇතුලත පූර්ණ වාර්තාව ඉදිරිපත් කල යුතුවේ. | නිශ්චිත පිළිතුරක් ලබාදී නොමැත. |
| (iii) | මුදල් රෙගුලාසි 237 | 193,000 | මුදල් රෙගුලාසි 237 ට පටහැනිව දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකරන ලද ව්‍යාපෘති 08 ක එකතු වටිනාකම වූ රු.103,000 ක් වූ වැඩ සහ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන් යටතේ සකපෝරු මිලදී ගැනීම සඳහා රු.90,000 ක | මුදල් රෙගුලාසි 237 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | අදාල කටයුතු මේ වන විට සිදුකර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | මුදල් ගෙවා තිබුණි. | | |
| (iv) | මුදල් රෙගුලාසි 315(1) | - | අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දෛනිකව එකතු වන මුදල් දින 07 ක් වැනි කාලයක් කාර්යාල සේප්පුවේ තැන්පත් කර තිබුණි. | මුදල් රෙගුලාසි 315(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | නිවැරදි කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත. |
| (v) | මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 937,230 | අතුරු අග්‍රිමයක් ලබාදීම මාණ්ඩලික නිලධාරියෙකුට පමණක් සීමා විය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2018 වර්ෂයේ අවස්ථා 57 ක දී රු.937,230 ක් මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි. | මුදල් රෙගුලාසි 371(2)(ඇ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අතුරු අග්‍රිමයක් දීම මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතුවේ. | මාණ්ඩලික නිලධාරීන් සීමිත බැවින්, ඔවුන්ගේ අධීක්ෂණය යටතේ මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත අග්‍රිම නිකුත් කරයි. |
| (ඇ) | 2016 සැප්තැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දිඹුලාගල, වැලිකන්ද, මැදිරිගිරිය, ඇලහැර හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වාහනවල 2018 වර්ෂයේදී ඉන්ධන දැවීම පරික්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දැවීම් පරික්ෂාවක් සිදුකල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |
| (ඈ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 | - | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන 04 ක්, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ට්‍රැක්ටර් බවුසර් 06 ක්, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන 05 ක් හා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන 05 ක් අදාල ආයතනය නමින් ලියාපදිංචි කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව රජයට අයත් වාහන අදාල ආයතනය නමින් පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණයඩ සමඟ එකඟ වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.3.3(6) ඡේදය | ඇලහැර හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉඩම් කච්චේරි පවත්වා තිබුණද, දින 75– 251 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව මූලික තේරීම් ලැයිස්තුව විරෝධතා සඳහා ප්‍රසිද්ධියට පත්කොට තිබුණි. | ඉඩම් කච්චේරි පවත්වා මූලික තෝරාගැනීම් ලේඛනය දින 14 ක් තුල විරෝධතා සඳහා ප්‍රසිද්ධියට පත්කොට විරෝධතා ලබාගත යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල නිවාස 02 ක පදිංචිකරුවන්ගෙන් රු.47,815 ක හිඟ මුදල් අයකරගෙන නොතිබුණි. | රජයේ නිවාස සඳහා හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |
| (ආ) | පළාත් රාජ්‍ය සේවයට ස්ථානමාරු ලද දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරිවරයාගේ උපලේඛනගත නිල නිවාසයේ පදිංචි, හිටපු ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් අයවිය යුතු නිවාස කුලිය අයකර ගෙන නොතිබුණි. | රජයේ නිවාස සඳහා හිඟ කුලී හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

**2.2 තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 371(2)(ආ) රෙගුලාසියට පටහැනිව අවස්ථා 03 කදී නිලධාරීන් වෙත රු.100,000 ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | මාණ්ඩලික නිලධාරියකු වෙත එක් වාරයකදී රු. 100,000 ක් ඉක්මවා අතුරු අග්‍රිම නිකුත් නොකල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී දින 10 ක් ඇතුලත නිරවුල් කල යුතුව ඇතත්, අවස්ථා 43 කදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් ලබාදී තිබුණු එකතුව රු.1,645,582 ක තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කිරීමේදී මාස 01 සිට මාස 10 ක කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. | කාර්යය නිමකර දින 10 ක් ඇතුලත ලබාගත් අතුරු අග්‍රිම මුදල් නිරවුල් කල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

**2.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව රු.36,439 ක් වටිනා හඳුනා නොගත් ගෙවීම් 06 ක් පැවතුණි. | චෙක්පත් මඟින් සිදුකරන ලද ගෙවීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

**2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිට | 2004 ඔක්තෝබර් 11 | ණය මුදල පියවන ලෙස |

| | | | |
|---|---|---|---|
| | තිබූ පලාත් සභා ආයතන සඳහා මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.582,060 ණය ශේෂ අයකරගෙන නොතිබුණි. | දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 ඡේදය පරිදි කටයුතු කර නිරවුල් කල යුතුවේ. | අදාල ආයතන වෙත දැනුම් දී ඇත. |
| (ආ) | මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු ණය ශේෂය රු.494,221 ක් පැවතුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කල යුතුවේ. | රු.254,645 ක ශේෂය මු.රෙ. 109 අනුව කපාහැරීමට ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. ඉතිරි රු.87,476 ක ශේෂය අයවී ඇති අතර, ගිණුම් සටහන් මඟින් පියවා නොමැත. |
| (ඇ) | වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයකර ගත යුතු එකතුව රු.1,164,963 ක් වූ ණය ශේෂයක් පැවතුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ ණය ශේෂ අය කිරීමට ඉදිරි නීතිමය කටයුතු සිදුකෙරේ. |
| (ඈ) | සැසඳුම් ප්‍රකාශය අනුව, සේවය හැරගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂවල එකතුව රු. 318,336 ක් වූ අතර, එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **XXIV** වැනි පරිච්ඡේදයේ 4.5 වගන්තිය පරිදි කටයුතු කල යුතුවේ. | රු.167,144 ක හිඟ ණය ශේෂ සඳහා නීතිමය කටයුතු සිදුකරන බවත්, රු.86,783 ක ශේෂය ඇපකරු මඟින් අයකර ගන්නා බවත් රු.64,409 ක ශේෂය අයවෙමින් පවතින බවත් දන්වා ඇත. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ---------------- | ------------------------ |
| ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2018 වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ව්‍යාපෘති 176 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි සැලසුම් කරන ලද සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුවේ. | ව්‍යාපෘති අනුමත නොකිරීම හා ප්‍රතිපාදන වෙන්කර නොදීම යන කාරණා මත එම තත්ත්වය ඇති වී ඇත. |

**3.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා නොගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කර්යාලය විසින් සිදුකරන ලද කුට්ටි ගල් ඇතිරීමේ ව්‍යාපෘති 04 ක ගල් සඳහා තත්ත්ව පරික්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණු අතර අල්ලා තිබූ ගල් විවිධ දුර්වලතාවලින් යුක්ත විය. | තත්ත්ව පරික්ෂණ වාර්තා ලබාගෙන අදාල යෙදවුම්වල ගුණාත්මකභාවය පිළිබඳ තහවුරු කර ගත යුතුවේ. | ටොන් 10 ඉක්මවා බර පටවාගෙන යාම නිසා මාර්ගයට හානි සිදු වී ඇති බවත්, එය යථා තත්වයට පත්කිරීම සිදුකර ඇත. |
| (ආ) | ලෝක ආහාර වැඩසටහන යටතේ රු.6,726,466 ක වියදමක් දරා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැව් 02 ක පාසි ඉවත්කර තිබුණ ද, සියලු පාසි ඉවත් කිරීමට නොහැකිවීම මත නැවත සීඝ්‍රයෙන් පාසි බෝවීමේ අවධානමක් පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවන ආකාරයට ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුවේ. | මිනිස් ශ්‍රමය යොදාගෙන පාසි ඉවත් කිරීම සිදුකර ඇති බැවින් සියල්ල අවසන් කිරීමට නොහැකි වී ඇත. |
| (ඇ) | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වගා ළිං සැකසීම සඳහා රු.20,000 බැගින් ප්‍රතිලාභීන් 44 කට සහ ගවගාල් සකස් කිරීම සඳහා වටිනාකම රු.17,240 බැගින් ප්‍රතිලාභීන් 04 දෙනෙකුට ලබාදෙන ලද ද්‍රව්‍ය ආධාර භාවිතයට ගෙන නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කර එහි ප්‍රතිඵල ලබාගන්නා තුරු පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදුකල යුතුවේ. | ප්‍රතිලාභීන්ගෙන් අදාල මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | ලංකාපුර පන්සල්ගොඩැල්ල නගරයේ පොදු වැසිකිලිය රු.582,000 ක වියදමින් ඉදිකර තිබුණි. එසේ වුවද, ප්‍රවේශ මාර්ගයක් නොමැති වීමෙන් මහජනතාවට පරිහරණය කිරීමට අවකාශයක් නොතිබුණු අතර ඒකක දෙකකින් සමන්විත වූ මෙම වැසිකිලියෙහි එක් ඒකකයක් අගුලු දමා වසා තිබුණි. | මහජනතාවගේ පරිහරණය සඳහා විවෘත කල යුතුවේ. | අඩුපාඩු සම්පූර්ණ කර නඩත්තු කටයුතු සඳහා අයිතිය ලංකාපුර ප්‍රාදේශීය සභාවට පවරා දෙනු ලැබේ. |
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකරන ලද පුදූර් මාර්ගයේ සමුපකාරය අසල පැති බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පිළියෙල කරන ලද මුල් ඇස්තමේන්තුවේ සඳහන් වැඩ අතුරින් රු. 1,160,676 ක වැඩ සිදු කර නොතිබුණි.මේ හේතුවෙන් එම වැඩ සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය කරගෙන නොතිබුණි. | ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය කල යුතුවේ. | අදාල අංශ මඟින් තොරතුරු ලබාගෙන ඉදිරිපත් කිරීමට සටහන් තබාගන්නා ලදී. |

**3.3 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මැදිරිගිරිය වෛදේහපුර බහුකාර්යය ගොඩනැගිල්ල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.500,000 ක් වැය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය. | මුදල් රෙගුලාසි 119 ප්‍රකාරව කටයුතු කර අදාල මුදල් අය කිරීම හා ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව අදාල අධීක්ෂණ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | රඳවුම් මුදල් නිදහස් නොකරන අතර ඇස්තමේන්තුව පරිදි සියලු ඉදිකිරීම් නැවත සකස් කරවනු ලැබේ. |
| (i) | වහලය සඳහා පිටපොත්ත සහිත දැව භාවිතා කර තිබූ අතර, ඇස්තමේන්තු ප්‍රකාරව නියමිත පරිමාණයේ රීප්ප, වැසිකිලි දොර සහ මුදුන් උළුකැට යොදාගෙන නොතිබුණි. | | |
| (ii) | දෙපස යොදන බීම්හි සනකම මැනුම්පත්‍ර අනුව නොතිබුණි. | | |
| (iii) | නාම පුවරුව සඳහා රු. 6,000 ක මුදලක් ගෙවා තිබුණද, නාම පුවරුවක් දක්නට නොතිබුණි. | | |
| (iv) | බිත්ති බැඳීමේදී ගඩොල් වෙනුවට බ්ලොක් ගල් භාවිතා කර ඉදිකිරීම් කටයුතු සිදුකිරීම හේතුවෙන් රු. 34,765 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ආ) | ලංසු වටිනාකම ඉක්මවා කොන්ත්‍රාත් පිරිනැමීම නිසා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 3 කින් රු.104,574 ක පාඩුවක් සිදුවී තිබුණි. | මුදල් රෙගුලාසි 119 ප්‍රකාරව කටයුතු කර අදාල මුදල් අය කිරීම හා ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව අදාල නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | තාක්ෂණික ඇගයීම් කමිටුව ඉදිරිපත් කර ඇති ලංසුවල ගණිතමය දෝෂ නිවැරදි කිරීමේදී එසේ වැඩි වටිනාකමකට ටෙන්ඩරය පිරිනමා ඇති අතර, අනවශ්‍ය පාඩුවක් සිදුනොවී නොමැත. |

## 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාවට ඇවිදින මං තීරුවක් රු. 1,959,698 ක වියදමින් ඉදිකර තිබුණි. එසේ වුවද ඇවිදින මං තීරුවක අවශ්‍යතාවය තහවුරු කරගෙන නොතිතිබූ කිසිවෙකු විසින් නඩත්තු හා පරිහරණය නොකරන ව්‍යාපෘතියක් වී තිබුණි. | විධිමත් ශක්‍යතා අධ්‍යනයකින් පසු ව්‍යාපෘති යෝජනාවන් සකස් කල යුතුවේ. | ඇවිදින මංතීරු භාවිතය පෙළඹවීමට ප්‍රදේශයේ ස්වෙච්ඡා සංවිධාන හරහා ජනතාව දැනුවත් කිරීමට කටයුතු කෙරේ. |
| (ආ) | දිඹුලාගල අලවාකුඹුර අංක 07 ඉඩම අසල මාර්ගයේ රු.490,000 ක් වැයකර බෝක්කුවක් ඉදිකර තිබුණ ද, එහි උරහිස් හා කාණු සකස් නොකිරීම හේතුවෙන් මාර්ගය විශාල ලෙස බාදනය වී කිසිදු වාහනයකට ගමන් කල නොහැකි වී තිබුණි. | බෝක්කු ඉදිකිරීමට සමගාමීව කාණු සකස් කිරීම සිදුකල යුතුවේ. | ඉදිරි වර්ෂයේදී ප්‍රතිපාදන වෙන් කරවාගෙන එම මාර්ග කොටස සංවර්ධනය කරනු ලැබේ. |
| (ඇ) | රු.1,479,000 ක වියදමින් ලංකාපුර සෝමපුර වසමේ ඉදිකර තිබූ පොදු ළිඳ හා වොලිබෝල් ක්‍රීඩා පිටිය නිශ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතිය ආරම්භ කර එහි ප්‍රතිඵල ලබාගන්නා තුරු පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදුකල යුතුවේ. | පොදු ළිඳ සඳහා ජල පෙරනයක් සවිකර ජලය බෙදාහැරීමට සහ ක්‍රීඩා පිටිය වටා දැල් ආවරණයක් යොදා භාවිතයට ගැනීමට කටයුතු කෙරේ. |
| (ඈ) | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රමවත් ශක්‍යතා අධ්‍යනයකින් තොරව කටුකැලියාව විහාරස්ථානයක උස් භූමියක් තුල රු.1,000,000 ප්‍රතිපාදන වටිනාකමින් යුතු කමතක් ඉදිකර තිබුණද, එම උස් භූමියට වී ප්‍රවාහනය අසීරු වී තිබුණි. | විධිමත් ශක්‍යතා අධ්‍යනයකින් යුතුව මහජන අවශ්‍යතා හඳුනාගෙන ව්‍යාපෘති ආරම්භ කල යුතුවේ. | අසීරුතා මධ්‍යයේ වුවද, වී ප්‍රවාහනය කරයි. |

**3.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ දී මැදිරිගිරිය පල්ලියගොඩැල්ලේ සිට වඩිගවැව දක්වා අලි වැටක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කි.මී. 5 ක දුරකට වැට ඉදිනොකිරීම නිසා එයට අදාල රු.1,229,965 උපකරණ නිශ්කාර්යව මැදිරිගිරිය සිවිල් ආරක්ෂක බලකා මූලස්ථානය භාරයේ පැවතුණි. | ඇස්තමේන්තු අනුව නියමිත කාල රාමුව තුලදී වැඩ නිම කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී නිම කිරීමට කටයුතු කෙරේ. |
| (ආ) | මැදිරිගිරිය සංස්කෘතික මධ්‍යස්ථානයේ රංග ශාලාව අලුත්වැඩියා කිරීම සඳහා වහලය ගලවා ඉවත් කිරීමෙන් පසු කොන්ත්‍රාත්තුව අත්හිටුවීම නිසා ඒ සඳහා දරන ලද රු.71,338 ක මුදලක් නිෂ්කාර්ය වී තිබුණි. | නිෂ්කාර්ය නොවන පරිදි රජයේ මුදල් භාවිතා කල යුතුවේ. | අදාල ගොඩනැගිල්ල පුළුල් කර සකස් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බවත්, ඒ සඳහා ප්‍රතිපාදන හා අනුමැතිය ලැබීමෙන් අනතුරුව ගොඩනැගිල්ල යථා තත්ත්වයට සකස් කිරීමට ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් දී ඇත. |

**3.6 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලංකාපුර බෞද්ධාර්ථගම ශ්‍රී සුභ සාධක මුල් ළමාවිය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ වහලයට යකඩ කාප්ප 4 ක් රු. 192,000 ක මුදලක් ගෙවා සපයා තිබුණද, 2018 නොවැම්බර් 23 දින වන විටද, එම කාප්ප සවිකර නොතිබුණි. | ඇස්තමේන්තුව අනුව නියමිත දිනට නියමිත වැඩ විෂය නිම කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී ප්‍රතිපාදන වෙන්කර ගෙන වහලයේ වැඩ නිම කිරීමට අපේක්ෂා කෙරේ. |

## 3.7 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්ත ශාලා ආරම්භ කිරීම වෙනුවෙන් ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා 2017 වර්ෂයේදී ලබාදුන් රු.367,000 ක ප්‍රතිපාදන සහ යන්ත්‍ර, උපකරණ හා අමුද්‍රව්‍ය, කර්මාන්තශාලාව ආරම්භ නොකිරීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකල යුතුවේ. | ඉදිරියේදී කර්මාන්තශාලා ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිසන්ධාන ඉලක්කගත ආර්ථික සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ සිල්ලර වෙළඳාමට පුද්ගලයින් දෙදෙනෙකුට රු.100,670 ක උපකරණ ලබාදී තිබුණ ද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කර ප්‍රතිලාභ ලබාගන්නා තුරු පසු විපරම් කටයුතු සිදුකල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන අතර, තවදුරටත් සොයා බලා ජීවනෝපාය කාර්යය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදීමට හා එසේ නොකරන්නේ නම්, ඉදිරියේදී භාණ්ඩ ආපසු ලබාගෙන වෙනත් ප්‍රතිලාභියෙකුට ලබාදීමට ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. |
| (ඇ) | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 තුළ පිහිටුවන ලද ග්‍රාම ශක්ති ජනතා සමිති 23 ක් සඳහා ජීවනෝපාය සංවර්ධනය යටතේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ලබාදෙන ලද රු.7,460,325 ක මුදල් උපයෝජනය කර නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කර අදාල ප්‍රතිලාභ ලබාගන්නා තුරු පසු විපරම් කටයුතු සිදුකල යුතුවේ. | ජීවනෝපාය සංවර්ධන අරමුදල වියදම් කිරීම සඳහා සමිතියේ කුඩා කණ්ඩායම් සහ පර්ෂදවල ගිණුම් කටයුතු ආරම්භ කිරීමට උපදෙස් ලබාදී ඇති නමුත් තවදුරටත් සමිති නිලධාරීන් දැනුවත් කර ව්‍යාපෘති ණය වැඩසටහන ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | 2017 කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘති ආරම්භ කර එහි ප්‍රතිඵල ලබාගන්නා තුරු පසු | ඉදිරියේදී මෙවලම් ලබාගත් ප්‍රතිලාභීන් සියලු |

| | | |
|---|---|---|
| විසින් කිතුල් මෙවලම් කට්ටල 20න් මෙවලම් 14 ක් ප්‍රතිලාභීන් වෙත මාස 09 ක කාල ප්‍රමාදයකින් පසුව බෙදාහැර තිබුණි. එම උපකරණ ආශ්‍රයෙන් කිතුල් ව්‍යාපෘති කිසිවක් ආරම්භ කර නොතිබුණි. | විපරම් කටයුතු අඛණ්ඩව සිදුකල යුතුවේ. | දෙනාම අදාල කාර්මාන්තයේ නියැලීමට බලාපොරොත්තුවෙන් සිටිමි. |

**3.8 ප්‍රසම්පාදනයන්**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | ------------------------ |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 මාර්ගෝපදේශය ප්‍රකාරව ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු. 629,140 ක වායුසමීකරණ යන්ත්‍ර හා සවිකිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීමක් සිදුකර නොතිබුණි. | තාක්ෂණික ඇගයීමක් සිදුකල යුතුවේ. | වායු සමීකරණ යන්ත්‍ර සවිකිරීම සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් ඇත. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් උද්‍යාන හා සනීපාරක්ෂක සේවාව ලබාගැනීම සහ සංවර්ධන ව්‍යාපෘති 02 ක් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට ජාතික තරඟකාරී ලංසු කැඳවීමේදී අවම දින 21 ක් ලබාදී නොතිබුණි. | ජාතික තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීමට දින 21 ක් ලබාදිය යුතුවේ. | විගණන විමසුම පිළිගන්නා අතර, අදාල සේවාව කඩිනමින් සලසාගත යුතුව තිබූ බැවින් මෙසේ දින 21 කට අඩු කාලයක් ලබා දී තිබේ. |
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 වගන්තිය ප්‍රකාරව ප්‍රජාපාදක සංවිධානයකට ව්‍යාපෘති කොන්ත්‍රාත් පිරිනමන අවස්ථාවේදී අදාල සංවිධානය කොන්ත්‍රාත් තුනකට වඩා වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක නිරත වී නොසිටිය යුතු බව දන්වා තිබුණි. ඊට පටහැනිව දිඹුලාගල සහ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පිළිවෙලින් වටිනාකම රු.2,235,207 ක් හා රු.935,000 ක් වටිනා කොන්ත්‍රාත් 04 බැගින් ප්‍රජාපාදක සංවිධාන 02 කට පිරිනමා තිබුණි. | කොන්ත්‍රාත් පිරිනමන අවස්ථාවේදී අදාල සංවිධානය කොන්ත්‍රාත් 03 කට වඩා වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක නිරත වී නොසිටිය යුතුවේ. | 01/2012 හි 3.3 ඡේදයට පටහැනිව එකම අවස්ථාවේදී ප්‍රජා සංවිධානයකට කොන්ත්‍රාත් 03 ක් ඉක්මවා ලබාදී නොමැති බව දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දන්වා ඇත. |
| (ඈ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා පොදු පහසුකම් ස්ථාපනය කිරීම හා වැසිකිළි පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුව ඉක්මවා 22.27% ක් වූ රු.12,205,845 ක අතිරේක ඇස්තමේන්තුව සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | අනුමත අවිනිශ්චිත ප්‍රතිපාදන ඉක්මවා ගිය විට කොන්ත්‍රාත් විචලන නියෝග අනුමැතිය සඳහා ප්‍රසම්පාදන අත්පොතේ සඳහන් අදාල අධිකාරී මට්ටම් වෙත යොමු කල | සීමිත තරඟකාරී මිළ ගණන් කැඳවීමේ ක්‍රමය යටතේ ආයතන 05 ක් සඳහා ලංසු ආරාධනා යවා ඇති අතර, ඉන් ආයතන 03 ක් පමණක් ලංසු ලේඛන ලබාගෙන ඇත. ඒ |

| | | | |
|---|---|---|---|
| | 8.13.4 ප්‍රකාරව අනුමැතිය ලබාගෙන නොතිබුණි. ව්‍යාපෘතියේ දින දීර්ඝ කිරීමක් සිදුකර ගෙන තිබුණද, කාර්යසාධන සුරක්ෂණය දීර්ඝ කරගෙන නොතිබුණි. | යුතුයි. කාර්යසාධන සුරක්ෂණය වැඩ නිම කිරීමට අපේක්ෂිත දින පසු වී දින 28 ක් දක්වා දීර්ඝ කරගත යුතුවේ. | අතුරින් ආයතන 02 ක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර, එක් ආයතනයක ලංසු සුරක්ෂණය පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු සුරක්ෂණය නොවන බැවින් එම ලංසුව ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව උක්ත කර්මාන්තයට පිළිගත හැකි එකම ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනයට, එම ලංසුකරුගේ මිලට අදාල කාර්යය කිරීමට එකඟ වී ලංසුව ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කර ඇත. |
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් සහ 5.4.4(i) මාර්ගෝපදේශය ප්‍රකාරව අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබා නොගෙන දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාජ සේවා අංශයේ ඉහල මහල ඉදිකිරීම සඳහා රු.605,334 ක් අත්තිකාරම් ගෙවා තිබුණි.නියමිත දිනට රු.713,553 ක් වටිනා වැඩ කොටස් නිම කර නොතිබුණු අතර ඉටු නොකල වැඩ වෙනුවෙන් රු.118,800 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(i) ප්‍රකාරව අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබාගත යුතුයි. එහි 5.4.8 හි විධිවිධාන ප්‍රකාරව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට පහකට නොඅඩු මුදලක් කාර්යසාධන සුරක්ෂණයක් වශයෙන් ලබාගත යුතුවේ. ඇස්තමේන්තුව පරිදි නියමිත දිනට නියමිත වැඩ විෂයයන් නිම කිරීමට කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

**3.9 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිඹුලාගල හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන 04 ක් නිෂ්කාර්යව පැවතුණි. | භාවිතයට ගැනීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරේ. |
| (ආ) | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගබඩාව තුළ ඕවහෙඩ් ප්‍රජෙක්ටරයක් හා රෝනියෝ මැෂිමක් වසර 08 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | භාවිතයට ගැනීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට කටයුතු කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නවීන ට්‍රැක්ටර් බවුසර් 10 ක් ස්වාභාවික ආපදාවන්ට ලක්වෙමින් වසරකට අධික කාලයක සිට කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කටයුතු කල යුතුවේ. | ප්‍රතිපාදන ලද පසු ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. |
| (ඈ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නිල නිවාසයක් වසර 06 කට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | උපයෝජනය කිරීමට කටයුතු කල යුතුවේ. | විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | වැලිකන්ද, ඇලහැර, දිඹුලාගල හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ස්ථාවර වත්කම් ලේඛණවල සියලු ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් ඇතුලත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |
| (ඊ) | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම හා ගොඩනැගිල්ල, නිල නිවාස ඉඩම් හා ගොඩනැගිලි, තක්සේරු කර වත්කම් ලෙස හඳුනාගෙන නොතිබූ අතර, නඩත්තු හා අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් වරින් වර දරන ලද රු.64,954,771 ක මුදල පමණක් වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. | වත්කම්වල වටිනාකම තක්සේරු කර නිවැරදි වටිනාකම් හඳුනාගත යුතුවේ. | වත්කම්, තක්සේරු කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත. |

**3.10** **පාඩු හා හානි**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වායු සමීකරණ යන්ත්‍ර මිළදී ගැනීමේ දී යන්ත්‍ර සඳහා ඉදිරිපත් කර තිබූ මිළ ගණන් සහ අනෙකුත් පිරිවිතර සියල්ලම එක හා සමානව තිබියදී 24000BTU ධාරිතාවයෙන් යුතු යන්ත්‍රයක් සඳහා රු.162,950 ක අවම මිළක් ඉදිරිපත් වී තිබුණ ද වැඩි මිළක් සහිත මාදිලියේ යන්ත්‍ර මිළදී ගැනීම නිසා රු.117,900 ක පාඩුවක් සිදුවී තිබුණි. | රජයට උපරිම වාසිදායක වන ආකාරයෙන් ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් කර ක්‍රියාත්මක කල යුතුවේ. | මිලදී ගනු ලැබූ සියලුම වායු සමීකරණ යන්ත්‍ර එකම වර්ගයෙන් හා එකම සේවා ඒජන්තවරයෙකුගෙන් මිලදී ගැනීමෙන් සේවා නඩත්තු කටයුතු පහසු කර ගැනීමටත්, කෙටි කාලීන ආර්ථික අවාසියක් පැවතුණද දිගු කාලීනව වඩා ඉහල ආර්ථික වාසියක් හා වායුසමීකරණ යන්ත්‍රවල දිගු කාලීන පැවැත්ම අපේක්ෂාවෙන් මිලදී ගන්නා ලදී. |
| (ආ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවිත්‍රතා සේවා සැපයීම් සඳහා වැඩ කළ දින ගණන පදනම් කරගෙන, ගෙවීම් කළ යුතුය.එසේ වුවද, අත්සන් ලේඛණය අනුව වැඩ කළ දින ගණනට වඩා මිනිස් දින 79 ක් සඳහා රු.75,181 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල් නැවත අයකර ගත යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |
| (ඇ) | ලංකාපුර ප්‍රාදේශීය ලේකම් නිල නිවාසයේ පදිංචිව සිටි කාලය වෙනුවෙන් හිටපු ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් ගෙවිය යුතු රු. **25,764** ක විදුලි බිල්පත ගෙවීමට කටයුතු කර නොතිබුණි.ඒ අනුව විදුලි බල මණ්ඩලය විසින් නිල නිවසේ විදුලි මීටරය ගලවාගෙන යාමෙන් සිදු වූ පාඩුව හා අදාල හිඟ මුදල අයකරගෙන නොතිබුණි. වසර **04** කට ආසන්න කාලයක් මෙම නිල නිවස නිෂ්කාර්යව පවතින බැවින් එහි ඇති උපකරණ සමඟ නිවස විනාශයට පත්වෙමින් පැවතුණි. | හිඟ කුලිය අයකර ගැනීමට හා වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කල යුතුවේ. | හිඟ මුදල එම ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් අයකර ගැනීමටත්, එම නිල නිවාසය ඉදිරියේදී සුදුසු නිලධාරියෙකුට පදිංචියට ලබාදෙන තුරු දේපල වල ආරක්ෂාව ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය නව ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීමේ ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු වූ රු. 20,978 ක් අයකර නොතිබුණු අතර අවසන් බිල්පත මඟින් ඉටු නොකල වැඩ විෂයන් 04 සඳහා | ප්‍රමාද ගාස්තුව හා වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | 2018 දෙසැම්බර් 20 දින දක්වා දින දීර්ඝ කිරීමක් සිදුකල අතර, 2018 දෙසැම්බර් 31 වන විට වැඩ කටයුතු වලින් |

| | | | |
|---|---|---|---|
| | රු.324,341 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | | සියයට 95 කට ආසන්න ප්‍රමාණයක් නිම වී තිබුණි. සවි කිරීම් කිහිපයක් ඉතිරි වී තිබූ අතර, ඒවා ඇලුමිනියම් කාර්මික ශිල්පියාගේ වැඩපලෙහි සකස් කර තිබුණු බැවින් ඒවා පරීක්ෂා කිරීමෙන් පසු ගෙවීම් කර 2019 ජනවාරි 15 දින වන විට අදාල සවිකිරීම් සිදුකර ඇත. |
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු නිවාඩු නිකේතනයට වායු සමීකරණ යන්ත්‍රයක් සවි කිරීම සඳහා තාක්ෂණික ඇගයීමකින් තොරව රු.170,484 ක් ගෙවා තිබුණි. වෙළඳපොල මිළ ගණන් සලකා නොබලා ස්වෙච්ඡා සංවිධානයක් වෙත එම කාර්යය ඉටුකිරීමට ලබාදීම හේතුවෙන්රු.40,984 ක් රජයට පාඩු වී තිබුණි. | රජයට උපරිම වාසිදායක වන ආකාරයෙන් ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුවේ. | උතුරු මැද පළාත් මිළ ගණන් අනුව මෙම වායු සමීකරණ යන්ත්‍රය සඳහා ඇස්තමේන්තු සකස් කර ඇත. ව්‍යාපෘතිය සිදුකර දින 14 ක් ඇතුලත ප්‍රගතිය ඉදිරිපත් කිරීමට තිබූ බැවින් සෘජු කොන්ත්‍රාත් ක්‍රමය මත අනුමත ප්‍රජාපාදක සංවිධානයක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබේ. ස්ථානයේ ස්වභාවය හා අනෙකුත් සවිකිරීම් උපාංග වල වෙනස්වීම නිසා මිල ගණන් වෙනස් වී ඇත. |
| (ඊ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ලොරි රථයක් අනතුරකට ලක්වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි104(4) ප්‍රකාරව තුන් මසක් ඇතුලත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. අනතුරෙන් සිදු වූ රු.1,027,750 ක අලාභය සඳහා වගකිව යුතු නිලධාරීන් නිශ්චය කරගෙන නොතිබුණි. | පරීක්ෂණයක් පවත්වා මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව තුන් මසක් ඇතුලතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර, අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුවේ. | පරීක්ෂණ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. |

**3.11** අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාව සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුවෙහි සඳහන් ධාරිතාවයකින් යුතු වායුසමීකරණ 7 ක් වෙනුවට ඊට දෙගුණයකින් වැඩිධාරිතාවයකින් යුතු වායුසමීකරණ යන්ත්‍ර 7 ක් සවිකිරීම හා ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා එක් යන්ත්‍රයක් සැලසුම් අංශයේ සවිකිරීම නිසා රු.509,077 ක අනවශ්‍ය වැය බරක් දැරීමට සිදුවී තිබුණි. | රජයේ මුදල් අරපිරිමැසුම් සහිතව වැයකල යුතු අතර ඇස්තමේන්තුවේ සඳහන් පිරිවිතරයන්ට අනුව කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |
| (ආ) | වැලිකන්ද සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ග්‍රාමීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල මාර්ග සංවර්ධනය කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් අන්තර් බන්ධිත ගල් මිළදී නොගෙන කොන්ත්‍රාත්කරු විසින්ම සපයා ගැනීමට ඉඩ ලබාදී ඒ සඳහා පළාත් මිළගණන් අනුව ගෙවීම් කිරීම හේතුවෙන් රු.3,134,751 ක් වැඩිපුර වැයකර තිබුණි. | මිළදී ගැනීම් සිදුකිරීමේදී රජයට වඩාත් ආර්ථික වාසියක් සහිත ක්‍රමයක් භාවිතා කල යුතුවේ | ව්‍යාපෘතිය අනුමත වන ආකාරය මත එය සිදුකර ඇත. |
| (ඇ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කිරීමේ විශේෂ වැඩසටහන යටතේ 2018 වර්ෂය තුලදී දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ග 09 ක් සඳහා කුට්ටිගල් ඇතිරීම වෙනුවෙන් සුඛිත පුරවර වැඩසටහනට සාපේක්ෂව වර්ග මීටරයකට රු.162 බැගින් රු.385,690 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | රජයට වඩාත් වාසිදායක ආකාරයට ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුවේ. | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන 2018 ක්‍රියාත්මක කරන විට දිස්ත්‍රික් ඉංජිනේරු විසින් ලබාදී ඇති මිල අනුව ඇස්තමේන්තු සකස් කර ඇත. |
| (ඈ) | ඇලහැර ගහේයාය ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ කම්බි දැල් වැට සඳහා ඉදිකරන ලද පැති බැම්ම වෙනුවෙන් දරන ලද රු. 100,491 ක වියදම, ව්‍යාපෘතිය අතර මඟදී කම්බි දැල් වැට සකස් නොකිරීමට තීරණය කිරීම හේතුවෙන් නිශ්කාර්ය වී තිබුණි. | සැලසුම් සකස් කිරීමේදී නිසි අවශ්‍යතාවය හඳුනාගෙන වඩාත් නිවැරදි සැලසුම් සකස් කල යුතුවේ. | අලි සඳහා යොදා තිබෙන විදුලි වැට අක්‍රීය වී තිබීම හේතුවෙන් වන අලි මෙම ක්‍රීඩාපිටිය හරහා ගමන් කර තිබේ. එම නිසා යෝජිත වැටට හානි සිදුවිය හැකි බැවින් වැට ඉදිකිරීමේ යෝජනාව පමණක් වෙනස් කල අතර, පැති බැම්ම තුලින් ක්‍රීඩාපිටිය තුලට ප්‍රධාන |

| | | |
|---|---|---|
| | | පාරේ සිට වැසි ජලය ගලා ඒම අවහිර වී ඇත. |

**3.12 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38(1)(ඉ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවක් තුළ විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට සහතික විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාලව 2019 පෙබරවාරි 26 වන දින දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 07 ක් සඳහා 2019 අප්‍රේල් 30 වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) වගන්තිය ප්‍රකාරව විගණන විමසුම් සඳහා නිශ්චිත කාලසීමාව තුළ පිළිතුරු සැපයිය යුතුවේ. | අදාල විගණන විමසුම් සඳහා 2019 මැයි 20 දින පිළිතුරු ලබා දී ඇත. |

**3.13 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිංචි පුද්ගලයන් දෙදෙනෙකුගේ කළුගල් කැණීම් බලපත්‍ර අවලංගු වී තිබූ නමුත්, තවදුරටත් එම ස්ථානයෙන්හි කැණීම් කටයුතු කරමින් පැවතුණි. | අනවසර කළුගල් කැණීම් තහනම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. | පෙන්වා දී ඇති කරුණු අදාල අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම ප්‍රාදේශීය ලේකම් වෙත පවරාගෙන නොතිබුණි. | ඉඩම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | පවරා ගැනීමට අදාල සියලු කටයුතු සිදුකර ඇත. |
| (ඇ) | ලංකාපුර හිටපු ප්‍රාදේශීය ලේකම්වරයෙකු භාරයේ පැවති රු.70,000 ක් පමණ වටිනා ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් ඔහු ස්ථානමාරු වී යාමේදී ආපසු කාර්යාලයට භාරගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාගැනීමට කටයුතු කල යුතුවේ. | පවරා ගැනීමට කටයුතු සිදුකරනු ලැබේ. |
| (ඈ) | ජනාධිපති කාර්යාලයේ ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය | ව්‍යාපෘති ආරම්භ | විගණනය විසින් පෙන්වා |

| | | | |
|---|---|---|---|
| | යටතේ ලංකාපුර දේවාල ගොඩැල්ල කෘෂි ජල ව්‍යාපෘතියේ විදුලි සම්බන්ධතාවය සඳහා අවශ්‍ය භාණ්ඩ 2017 වර්ෂයේ ලබා දී තිබුණ ද, විදුලි සම්බන්ධතාවය ලබානොගැනීම නිසා එම භාණ්ඩ/ උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | කර එහි ප්‍රතිඵල ලබාගන්නා තුරු අඛණ්ඩව පසු විපරම් කටයුතු සිදු කල යුතුවේ. | දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන්ට බෙදාහැරීමට නියමිත උපකරණ කට්ටල 06 ක් හා විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ ස්වෙච්ඡා සංවිධානවලට බෙදාහැරීමට නියමිත රු.387,886 ක් වූ භාණ්ඩ අයිතම 318 ක් ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගබඩාවේ පැවතුණි. | ව්‍යාපෘති සැලසුම් කල පරිදි අප්‍රමාදව නිම කිරීමට කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණ සමග එකඟ වේ. |
| (ඊ) | පුලස්තිගම මහජන ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අතර, 2017 ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.1,000,000 ක ප්‍රතිපාදන මත කණු යොදා පහල මහල් ස්ලැබ් එක දමා තිබුණ ද, යොදා තිබුණු වානේ කම්බි වාතයට නිරාවරණය වී තිබීම හේතුවෙන් මල බැදී තිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඇස්තමේන්තු පිළියෙල කල යුතුයි. ගොඩනැගිල්ල විනාශ වීමට ඉඩ නොහැර ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා අවධානය යොමු කල යුතුවේ. | එකවර ප්‍රතිපාදන ලබාගැනීමට නොහැකි බැවින් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොමැති අතර, ඉදිරියේදී අපේක්ෂිත ප්‍රතිපාදන ලැබුනහොත් සියලු වැඩ කටයුතු ද සිදුකල හැකිය. |
| (උ) | ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන යටතේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ රු.1,076,010 කට මිලදීගෙන තිබූ වතුර මෝටර් 39 න් 12 ක්, බෙදාදීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රතිලාභීන් හඳුනාගෙන බෙදාදීමට කටයුතු කල යුතුවේ. | බෙදා අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඌ) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් ලිපිගොනු විෂයට අදාලව විශ්‍රාම වැටුප් නිලධාරියෙකු පත්කර නොතිබූ අතර, ඒ සඳහා විෂයය සම්බන්ධ පුහුණුවක් ලබා නොදුන් සංවර්ධන නිලධාරිනියක් යොදවා තිබුණි. | විෂය නිලධාරියෙකු පත්කර අදාල විෂය පිළිබඳ පුහුණුවක් ලබාදීම මගින් මහජනයාට උපරිම සේවයක් සැපයීමට හැකි පරිදි මානව සම්පත් කළමනාකරණය කල යුතුවේ. | නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. |
| (එ) | ඇලහැර සහ අත්තනකඩවල සමෘද්ධි ප්‍රජාමූල බැංකු මගින් ගිණුම් හිමියන් 163 දෙනෙකුට ලබාදුන් රු.6,357,487 ක ණය මුදල් අයකර ගැනීමට කටයුතු | ගෙවීම් පැහැර හැර ඇති ණය අයකර ගැනීමට කටයුතු | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | කර නොතිබුණි. | කල යුතුවේ. | |
| (ඒ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.3.4 ඡේදය ප්‍රකාරව මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් නොමැති පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ලේඛනය යාවත්කාලීන කර එහි පිටපතක් පළාත් ඉඩම් කොමසාරිස් හා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවා නොතිබුණි. | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරණ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.3.4 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත. |
| (ඔ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකරන ලද අත්තනකඩවල යාය 25-26 හා 25-12 අපවහන ඇල මාර්ගය සඳහා බෝක්කු 02 ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාල ප්‍රමාද දින 73 සඳහා රු.290,544 ක ප්‍රමාද ගාස්තුව අවසන් බිල්පතෙන් අඩුකරගෙන නොතිබුණි. | ගිවිසුම් අනුව නියමිත දිනට වැඩ නිම කල යුතුවීම හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සිදුකල යුතුවේ. | අදාල අංශ වෙතින් තොරතුරු ලබාගෙන ඉදිරිපත් කිරීමට සටහන් කරගෙන ඇත. |
| (ඕ) | ඇලහැර හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල බදුකරුවන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ඉඩම් බදු ආදායම රු.915,765 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ඉඩම් බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

**4 තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

-----------------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම, කාර්යමණ්ඩලවල පුහුණුව හා අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධ කරගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර නොතිබුණි.

**5 යහපාලනය**

------------

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | ------------------------ |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සමාජ සේවා අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යවන ලද දිඹුලාගල, මැදිරිගිරිය, ඇලහැර වැලිකන්ද හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ වකුගඩු දීමනා ලැබිය යුතු පුද්ගලයන් 341 ක්, ආබාධිත සහිත පුද්ගලයින් 100, වැඩිහිටි | වැඩි ප්‍රතිලාභීන් ප්‍රමාණයකට දීමනා අනුමත කර ගැනීමට කටයුතු කල | ප්‍රතිපාදන සීමාව තුළ ගෙවීම් කටයුතු සිදුකරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | දීමනාව අපේක්ෂිත පුද්ගලයින් 1,951 දෙනෙකුට පොරොත්තු ලේඛණයේ රැඳී සිටීමට සිදු වී තිබුණි. | යුතුවේ. | |
| (ආ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල පිහිටි විහාරස්ථාන 48 ක්, පාසල් 18 ක්, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන 16 ක් සඳහා ද, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආයතන 214 ක් සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් කැබලි 149 කට අදාලව ඉඩම් පැවරුම් කටයුතු සිදුකර නොතිබුණි. | ඉඩම් පැවරීමේ කටයුතු කඩිනමින් කල යුතුවේ. | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පැවරුම් කටයුතු සිදුකිරීමට කටයුතු යොදා ඇත. |
| (ඇ) | ජනාධිපතිවරයා විසින් අත්සන් කර තිබූ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාල ඔප්පු 292 ක් හා බලපත්‍ර 113 ක් සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාල ඔප්පු දීමනා පත්‍ර 25 ක් සඳහා බෙදාදීමට හෝ හඳුනාගත නොහැකි හා ගැටළු සහිත ඔප්පු හා බලපත්‍ර අවලංගු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ප්‍රතිලාභීන් හඳුනාගෙන බෙදාදීමට හෝ හඳුනාගත නොහැකි හා ගැටළු සහිත ඔප්පු හා බලපත්‍ර අවලංගු කිරිමට කටයුතු කල යුතුවේ. | ඉදිරි කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් දැනුවත් කරනු ලැබේ. |
| (ඈ) | ඉඩම් කොමසාරිස් 157 අනුව ලංකාපුර ග්‍රාම නිලධාරි වසම් 26 ක ලියාපදිංචි ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව 449 කින් කිසිදු පුද්ගලයෙකුට ඉඩම් ලබා දී නොතිබුණි. | ලියාපදිංචි ඉල්ලුම්කරුවන් සඳහා ඉඩම් ලබාදීමට කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. |
| (ඉ) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 189 කොටලීය ග්‍රාම නිලධාරී වසමේ අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ලද පැමිණිලි 27 කින් පැමිණිලි 17 ක් සම්බන්ධයෙන් කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණි. | විමර්ශන පවත්වා අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පරිපාලන ග්‍රාම නිලධාරී විසින් පරික්ෂා කර ඉදිරි නීතිමය කටයුතු සිදුකරනු ලැබේ. |
| (ඊ) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දීමනා පත්‍ර හා ජය භූමි පත්‍රවල පිටපත් 559 ක ප්‍රමාණයෙන්, මැනුම් කිරීමකින් හා රේඛා චිත්‍ර ලබාගැනීමකින් තොරව ලබාදී ඇති දීමනා පත්‍ර හා ජය භූමි පත්‍ර ප්‍රමාණය කොපමණ ද යන්න හඳුනාගෙන, එය මැනුම් කිරීමට හා රේඛා චිත්‍ර ලබාගැනීමට අවධානය යොමු වී නොතිබුණි. | මැනුම් නියෝග හා රේඛා චිත්‍ර ලබාගැනීමකින් තොරව ලබාදී ඇති දීමනා පත්‍ර හා ජය භූමි පත්‍ර ප්‍රමාණය හඳුනාගෙන ඉදිරි කටයුතු සිදුකල යුතුවේ. | ඉදිරියේදී තිරසර විසඳුම් ලබාදෙමි. |
| (උ) | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 263-කරපොළ ග්‍රාම නිලධාරී වසමේ ඇති වූ හදිසි සුළි සුළං ආපදා තත්ත්වයෙන් හානි වූ නිවාස 9 ක් සඳහා හානි රක්ෂණ මුදල් වූ රු.312,125 ලැබී නොතිබුණි. | හානි රක්ෂණ මුදල් ලබාගෙන හානි වූ නිවාස හිමියන් වෙත | ආපදා සහන කටයුතු සිදුකිරීමට ප්‍රාදේශීය ලේකම් දැනුවත් කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | | ලබාදීමට කටයුතු කල යුතුවේ. | |
| (උ) | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව මහජනයාට අවශ්‍ය තොරතුරු අප්‍රමාදව ලබාදිය යුතු වුවත්, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එසේ තොරතුරු ලබාදී නොතිබූ අවස්ථා 03 ක් පැවතුණි. | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | තොරතුරු නිලධාරි විසින් වාචිකව ලබාදුන් තොරුතුරු වලින් තොරතුරු ඉල්ලූ පාර්ශව සෑහීමකට පත්වී ඇති අතර ලිඛිත තොරතුරු ඔවුන් අපේක්ෂා කර නොතිබුණි. |
| (එ) | පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය මඟින් ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් කට්ටිකරුවන් 828 ක් වෙනුවෙන් 2015 වර්ෂයේ පවත්වා තිබූ ඉඩම් කච්චේරිවලට අදාල ඉඩම් කට්ටිකරුවන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් බලපත්‍ර ලබාදීම විධිමත් කල යුතුවේ. | ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අනුමැතිය ලද විගස ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. |
| (ඒ) | 2018 වර්ෂයේ ඡන්ද නාම ලේඛයනට අනුව ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජාතික හැඳුනුම්පත් නොමැති පුද්ගලයන් 1,809 ක් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදුකර ජාතික හැඳුනුම්පත් අයදුම් කිරීමට යොමු කර නොතිබුණි. | පසු විපරම් කටයුතු සිදුකර ජාතික හැඳුනුම්පත් අයදුම් කිරීමට මහජනතාව යොමු කරවිය යුතුවේ. | ජංගම සේවා කිහිපයක් හෝ පවත්වා හැඳුනුම්පත් නොමැති පුද්ගලයින්ට හැඳුනුම්පත් ලබාදීමට අපේක්ෂා කෙරේ. |

**5.2 අභ්‍යන්තර විගණනය**

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන අංශය විසින් 2018 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් එකදු විගණන විමසුමක් හෝ ඉදිරිපත් කර නොතිබුණි. | සියලු කාර්යාල ඇතුලත් වන පරිදි මුදල් රෙගුලාසි 133 හි සඳහන් කාර්යභාර්යයන් අභ්‍යන්තර විගණනය විසින් පරික්ෂා කල යුතුවේ. | විගණන නිලධාරීන්ගේ හිඟකමක් පැවතීම හේතුවෙන් විගණන විමසුම් ඉදිරිපත් කිරීමේ අඩුවක් දක්නට ලැබේ. |

**6 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව කටයුතු නොකර ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ වසර 07 ත් 25 ත් අතර කාලයක් සේවය කරන නිලධාරීන් 29 ක් විය. | අඛණ්ඩ සේවා කාලය අවුරුදු 05 ඉක්ම වූ නිලධාරීන් සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තිය | ස්ථාන මාරු සඳහා අයදුම් කලද, මෙතෙක් ඊට යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. |

ක්‍රියාත්මක කල
යුතුවේ.